මහනුවර මහා නගර සභාව

මහනුවර දිස්ත්‍රික්කය

-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුළ රු.1,310,256 ක වටිනාකමක් සහිත ණයහිමි ශේෂ ගිණුම්ගත කර නොතිබුණි. | ණයහිමි ශේෂය නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වර්ෂය තුළ මිල දී ගත් රු.111,850 ක ලී බඩු හා උපකරණ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී රාජසිංහ මාවත යා කරන මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ අවසන් බිල්පත සඳහා වූ ණයහිමි වටිනාකම රු.147,337 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | බිල්පත් අනුව, වර්ෂ අවසාන කර්මාන්ත ණයහිමි වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මේ පිළිබඳව සොයා බලා නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට දැන්වීම් පුවරු ආදායම රු.17,654,095 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2018.12.31 දිනට රු.27,781,732.38 මුදලක් ලැබිය යුතුව තිබුණි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ කඩ කාමර 877 ක් සඳහා වූ ආදායම රු.2,478,869 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | කඩ කුලි ආදායම් බිල් කිරීම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වේ. | අදාළ තොරතුරු සොයා බලා ගැලපීම් සිදු කර නිවැරදි පිළිතුරක් විගණනයට ඉදිරිපත් කරමි. |
| (ඊ) | වර්ෂය තුළ ඉටු නොකළ කර්මාන්ත 03 ක රු.11,812,087 ක ශේෂයක් ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරන අතර, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ගිණුම් විෂයයන් 08 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව, ශේෂ හා උපලේඛන අනුව ශේෂ අතර රු.82,809,745 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුර පසුව ලබා දෙන බව දන්වමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ජල කර්මාන්ත අංශයේ විවිධ ණයගිම් ශේෂය හා ගිණුම අනුව, ණයගිම් ශේෂය අතර රු.16,886,927 ක වෙනසක් පැවතුණි. | ණයගිම් ශේෂය නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) ගල්, මැටල්, ප්‍රිමික්ස් ගබඩා ණයගිම් ලේඛන වටිනාකමත්, ගිණුම අනුව, වටිනාකමත් අතර රු.206,882 ක වෙනසක් විය. | ගබඩා ණයගිම් ලේඛන සහ ගිණුම් අංශ තොරතුරු සැසඳෙන පරිදි පවත්වා ගෙන යා යුතු වේ. | නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඈ) පරිගණක මෘදුකාංගය අනුව, ජල විකුණුම් ආදායම හා මූල්‍ය ප්‍රකාශන අනුව, එම ආදායම අතර රු.5,785,325 ක වෙනසක් පැවතුණි. | නිවැරදි ආදායම හඳුනා ගත යුතු වේ. | නිවැරදි පිළිතුරක් විගණනයට ඉදිරිපත් කරමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.200,662,489 ක් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟය වසර 10 කටත් වඩා දීර්ඝ කාලයක සිට අඛණ්ඩව පැවත එන ශේෂයක් බව දන්වමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ශේෂවල එකතුව රු.414,926,972 ක් වී තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | භාණ්ඩ සපයා නොමැති ඇණවුම් සම්බන්ධව අදාළ ආයතනවලින් කරුණු විමසා ඇණවුම් අවලංගු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා ආදී අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.1,628,738,650 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේ දී | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු වන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ගබඩාකරණය පිළිබඳ සංකීර්ණතාවය සහ මානව සම්පත් හිඟතාවය අනුව, ගබඩා සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත. |

සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.4 අනුකූල නොවීම

1.4.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | xv වැනි පරිච්ඡේදයේ 10.1.1 වගන්තිය | විදේශ සංචාරය දීර්ඝ කිරීමට අදාළ අනුමැතිය කල් ඇතිව ලබා ගත යුතු වුවත්, මහා නගර සභා නිලධාරීන්ගෙන් දෙදෙනෙකු අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම විදේශ සංචාරයට සහභාගීවීමෙන් පසු සිදු කර තිබුණි. | ආයතන සංග්‍රහයේ අදාළ ඡේදයන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. | විදේශ නිවාඩු දීර්ඝ කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කළ ලිපියේ පිටපතක් අමුණා එවා ඇත. |
| (ආ) | 2003 සැප්තැම්බර් 05 දිනැති අංක 1304/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ iv(අ) කොටසේ පළ කර තිබුණු මහනුවර මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවෙහි III කොටස, 04 වන ඡේදය | කටුගස්තොට නව ජල නළ එළීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු/ පිරිවිතර පිළියෙල කළ හා නිර්දේශ කළ නිලධාරීන් දෙදෙනෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් ලෙස පත් කර තිබූ බැවින්, කමිටුවේ ස්වාධීනත්ත්වය ආරක්ෂා වී නොතිබුණි. | ගැසට් පත්‍රය අනුව, නිවැරදිව අදාළ කමිටු සඳහා නිලධාරීන් පත් කළ යුතු වේ. | වෙනත් ස්වාධීන පුද්ගලයින් තිදෙනෙකු කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කර ඇත. |

1.4.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.26,134,498 ක සැපයුම් ණයහිමි වටිනාකමක් අනුමැතියකින් තොරව ජ'නල් සටහන් මඟින් ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | ජ'නල් සටහන් ගැලපීම නිසි අනුමැතියක් යටතේ සිදු කළ යුතු වේ. | මේ සම්බන්ධව තොරතුරු සොයා බලා වාර්තා කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.586,748,840 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.520,473,900 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාවේ ජංගම ගිණුමකට අවස්ථා 35 කදී, තැන්පත් කර තිබූ රු.1,202,458 ක් වටිනා චෙක්පත් උපලබ්ධි නොවීම හා අවස්ථා 14 ක දී ලද රු.294,043 ක හඳුනා නොගත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | උපලබ්ධි නොවූ චෙක්පත් සහ හඳුනා නොගත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | අදාළ තොරතුරු සොයා බලා අදාළ ගැලපීම් කර, මේ පිළිබඳ පිළිතුරක් ඉදිරිපත් කරමි. |
| (ආ) විවිධවල වාහන නතර කිරීමේ ගාස්තු වෙනුවෙන් අවස්ථා 11 කදී ලැබී තිබූ රු.14,445,000 ක් වටිනා චෙක්පත් බදු ආයතනයේ එක් නිලධාරියෙකු පමණක් අත්සන් කර, ඉදිරි දිනයන් යොදා ලබා දී තිබූ අතර, සභාව එම චෙක්පත් ප්‍රතික්ෂේප නොකර, භාර ගෙන තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව මුදල් අය කළ යුතු වේ. | චෙක්පත් කීපයක් පමණක් ප්‍රමාද වී ලබා දුන් අතර, ප්‍රමාද සඳහා දඩ ගාස්තු අය කර ඇත. |

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 878,245,000 | 731,472,381 | 634,109,151 | 252,948,621 | 839,543,000 | 951,640,588 | 821,071,501 | 285,599,883 |
| (ii) | කුලී | 123,276,000 | 119,538,223 | 112,010,789 | 74,296,012 | 116,533,000 | 65,179,198 | 67,087,038 | 62,046,007 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 51,854,100 | 46,569,841 | 46,568,941 | -- | 46,495,000 | 31,227,877 | 31,227,877 | -- |
| (iv) | වෙනත් ආදායම් | 615,797,000 | 607,869,074 | 484,052,597 | 806,186,283 | 576,462,000 | 476,941,161 | 322,459,698 | 424,389,671 |
| | එකතුව | 1,669,172,100 | 1,505,449,519 | 1,276,741,478 | 1,133,430,916 | 1,579,033,000 | 1,524,988,824 | 1,241,846,114 | 772,035,561 |

2.3.2 <u>ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.772,035,561 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.1,133,430,916 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 47 ක් විය. | හිඟ ආදායම් වර්ධනය වීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුර පසුව ලබා දෙමි. |

2.3.3 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම්<br>----------<br>සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.323,328,933 ක් වුවත්, ඉන් රු.194,358,480 ක් පමණක් අය කර තිබුණි. | වරිපනම් බදු රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කරගත යුතු වේ. | හිඟ ආදායම් 2019 වර්ෂයේ අය කිරීමට කටයුතු කර ගෙන යන බව දන්වමි. |
| (ආ) ඉඩම් බදු<br>----------<br>වර්ෂය ආරම්භයට පැවති රු.33,063,413 ක් වූ ඉඩම් බදු හිඟයෙන් වර්ෂය තුළ රු.31,188,223 ක් හෙවත් සියයට 94 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ඉඩම් බදු අය කිරීමේ ප්‍රගතිය වර්ධනය කරගත යුතු වේ. | බදු ගෙවීම් පැහැර හැරීම හේතුවෙන්, හිඟය පවතින අතර, මේ වන විට සැලකිය යුතු ප්‍රගතියක් ඇත. |
| (ඇ) ජල බදු<br>---------<br>සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 31 දිනට රු.50,000 කට වැඩි හිඟ ශේෂයක් පැවති පාරිභෝගිකයින් 31 කගෙන් මාස 01 ත් 123 ත් අතර කාල පරාසයක සිට අය විය යුතු රු.11,976,307 ක් අය කර නොතිබූ අතර, බිල්පත් හිඟව තිබිය දී, ජලය ලබා දීමට කටයුතු කර තිබුණි. | ජල ගාස්තු නොගෙවීම සම්බන්ධ ක්‍රියාමාර්ග ගත යුතු වේ. | විගණනයෙන් පෙන්වා දීමෙන් පසුව හිඟ ශේෂය පසු විපරම් කිරීමට හැකි වන පරිදි ජල අංශයේ කටයුතු විධිමත් කොට ඇති අතර, හිඟ ශේෂය අය කිරීමට කටයුතු කරමින් පවතී. |

2.3.4 <u>කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කඩ කුලී<br>---------<br>මහනුවර දුම්රිය පොල පාර එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරණායක මාවතේ කඩ කාමරවලින් අය විය යුතු රු.22,055,500 ක එක් වන් මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක්වන් මුදල් අය කර ගත යුතු වේ. | හිඟ ගාස්තු නොගෙවන ලද කඩ කාමර මුද්‍රා තබන ලෙස දැනුම් දී ඇති බැවින්, ඒ සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) ගෙවල් කුලී<br>------------<br>සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ නිවාස කුලී ශේෂය රු.1,177,717 ක් වූ අතර, ඉන් 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයක සිට හිඟ හිටි ශේෂය රු.1,026,259 ක් විය. | හිඟව පවතින ගෙවල් කුලී අය කරගත යුතු වේ. | පිළිතුරු පසුව ලබා දෙන බව දන්වමී. |

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.12,733,266 ක් හා රු.272,828,257 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කරගත යුතු වේ. | හිඟයෙන් කොටසක් ලැබී ඇති අතර, ඉතිරි මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

මහා නගර සහා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඉටු නොකළ කාර්යයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ බයෝ ගෑස් ව්‍යාපෘතිය සඳහා රු.3,000,000 ක මුදලක් වෙන් කර තිබුණ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | කාර්යයන් වර්ෂය තුළ දී, ඉටු කිරීමට කටයුතු කළ යුතු වේ. | සනීපාරක්ෂක බිම් පිරවුම සැකසීමට මුදල් ප්‍රතිපාදන අයවැයෙන් වෙන් කර නොතිබීම මත එම මුදල බිම් පිරවුමට යොදවා ගන්නා ලදී. |
| (ii) | ක්‍රියාත්මක සැලැස්ම අනුව, නගරයේ වායුගෝලීය දූෂණ තත්ත්වය හඳුනා ගැනීම සඳහා මිණුම් උපකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණ ද, ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කර ඇති කාර්යයන් ඉටු කළ යුතු වේ. | රු.20,000,000 කට වඩා වැඩි මුදලක් වැය වන අතර, සභාවට එම ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වීම මත මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2014 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් සභාවට ලබා දී තිබුණු ධාරිතාවය ලීටර් 150 – 200 ක් වූ පොලිතින් අපද්‍රව්‍ය කැබලි කරන කම්පැක්ටර් යන්ත්‍රය අදාළ අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි. | සභාව සතු සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගත යුතු වේ. | අදාළ පරිශ්‍රයේ ඉඩකඩ සීමිත බව ද, සැලකිල්ලට ගෙන මෙම යන්ත්‍රය පොලිතින් කැට කිරීම සඳහා යොමු කර නොමැත. |
| (ii) | ගෘහ ඒකක 26,722 ක් සඳහා කොම්පෝස්ට් බැරල් බෙදා දීමට රු.7,000,000 ක ප්‍රතිපාදන වෙන් | වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් උපරිම | කොම්පෝස්ට් බඳුන් නිෂ්පාදනය කරනුයේ එකම නිෂ්පාදකයෙක් වන අතර, |

| | | |
|---|---|---|
| කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ රු.1,635,650 ක් වැය කර, බැරල් 470 ක් පමණක් මිල දී ගෙන බෙදා දී තිබුණි. | ඵලදායීතාවයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඔහුට ලැබී ඇති ඇණවුම් ප්‍රමාණය සැපයීමට ඇති නොහැකියාව මෙයට හේතු වී ඇත. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සඳහා සැලැස්මක් සකස් කර නොතිබුණු අතර, ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා වීම සඳහා සැලැස්මක් සකස් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | තිරසර සංවර්ධනය යන වචනය සඳහන් නොවූවත්, ඉන් බලාපොරොත්තු වන කාර්යයන් සභාව විසින් සභාව පිහිට වූ දින සිට මේ දක්වා ඉටු කර ඇත. |

(ඈ) <u>ඉ - රාජ්‍ය සංකල්පය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2011 ජුනි 24 දිනැති අංක SP/SB/06/11 දරන ජනාධිපති ලේකම් විසින් නිකුත් කළ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියට අදාළ චක්‍රලේඛය ප්‍රකාරව, තොරතුරු සන්නිවේදන තාක්ෂණ සැලැස්මක් පිළියෙල කිරීම, පරිගණක මෘදුකාංග පද්ධතිවල තොරතුරු සම්බන්ධව ආරක්ෂිත ක්‍රමවේදයක් අනුගමනය කිරිම හා පද්ධති භාෂා 03 න්ම භාවිතා කිරීමට හැකි ආකාරයට පවත්වා ගෙන යාම ආදී කටයුතු සිදු කර නොතිබුණි. | ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව, නිර්නායක අනුව කටයුතු කළ යුතු වේ. | සැලැස්මක් සකස් කිරීමට ප්‍රධාන නව්‍යකරණ තනතුරක් අනුමත කර ගැනීමට හා ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳ ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කර ඇති අතර, භාෂා 03 ම භාවිතා කිරීමට ඉදිරියේ දී, බලාපොරොත්තු වෙමි. |
| (ii) | ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති II කොටසේ අංක 020102 ට අනුව, රාජ්‍ය ආයතන විසින් රුපියල් මිලියන 02 ට වැඩි තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙන් උපදෙස් ගෙන පොදු ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතු වුවත්, සභාව ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා ඉහත පරිදි කටයුතු කර නොතිබුණි. | ඉ - රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව, රුපියල් මිලියන 02 ට වැඩි තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ උපදෙස් ලබා ගෙන පොදු ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී, ICTA නියෝජිතයෙකු යොදවා ඉතිරි කටයුතු සිදු කිරීමට අදහස් කරමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය වංචාවකට වැරදිකරු වූ රථ පාලිකාවක් නැවත සේවයේ පිහිටුවා රථ වාහන පාලිකා අංශයට අනුයුක්ත කර, රථ වාහන පාලිකාවන් එකතු කරන මුදල් ලබා ගැනීමේ සිට බැංකුගත කිරීම දක්වා සියලු අධීක්ෂණ කටයුතුවල යොදවා තිබුණි. | නිවැරදි අධීක්ෂණයක් යටතේ රාජකාරී පැවරිය යුතු වේ. | රැකියා විස්තරය නිකුත් කර තිබුණ ද, සත්‍ය වශයෙන්ම එලෙස කටයුතු නොකරයි. |
| (ආ) | පෞද්ගලික ඉන්ධන පිරවුම්හලකට ලබා දී ඇති ජල සැපයුම මගින් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.399,530 ක හිඟ ජල ගාස්තු අය කර නොතිබූ අතර, ජල සැපයුම විසන්ධි කිරීම හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පාරිභෝගිකයා දැනුවත් කර, හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | මධ්‍යම වෙළඳ පොල අංක 162 දරන මස් කඩය ගිවිසුම්ගත වීමකින් තොරව 2016 ජූනි 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.3,726,000 කට ටෙන්ඩර් මත බදු දී තිබුණි. | මස් කඩ බදු දීමේ දී, ගිවිසුමකට එළඹිය යුතු වේ. | 2016 අගෝස්තු 30 දින වන විට වරෙන්තු නිකුත් කර ඇති අතර, ගිවිසුම් සඳහා අදාළ ගාස්තුව ගෙවා ඇතත්, ගිවිසුම් අත්සන් කිරීමට මෙතෙක් පැමිණ නොමැත. |
| (ඈ) | ඉදිකිරීම් අනුමැතිය නොලැබූ ගොඩනැගිල්ලක් සඳහා ව්‍යාජව ඇඳ ඉදිරිපත් කළ සැලැස්මට මහා නගර සභාව සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර තිබූ අතර, ගොඩනැගිලි සැලැස්මට නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ද නොතිබූ බැවින්, ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ගයන් ගත යුතු වේ. | අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම යටතේ නඩු පැවරීමට කටයුතු කර ඇත. |
| (ඉ) | සැලසුම් අනුමත කර ගැනීමකින් තොරව 2015 වර්ෂයේ මහනුවර සිරිමාවෝ බණ්ඩාරණායක මාවතේ, ඉදිකිරීම් ආරම්භ කළ ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසන් වන විට මහල් 07 ක් දක්වා ඉදිකර තිබූ අතර, සභාව නිසි පරිදි කටයුතු නොකිරීම නිසා, වර්තමානය වන විට නඩු කටයුත්තක් පැන නැඟී තිබුණි. | සැලසුම් අනුමත කර නොගත් ගොඩනැගිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | නඩු පවරා ඇත. සැලසුම් ඉදිරිපත් කර ඇති අතර, දැනට එම ගොනුව ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| (ඊ) | අනවසර ඉදිකිරීම් වෙනුවෙන් අය කළ රු.80,583,133 ක් ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘති ඉටු කිරීමට භාවිතා නොකර, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව අදාළ ව්‍යාපෘති සඳහා අරමුදල් භාවිතා කළ යුතු වේ. | බෝගම්බර පොරොත්තු බස් නැවතුම්පොල අසල පවතින කඩ කාමර ඉවත් කර, නැවත එම කඩ |

| | | | |
|---|---|---|---|
| | | | කාමර ස්ථාපිත කිරීමට සහ පදික වේදිකා හා වැටවල් නිසි ප්‍රමිතියට අනුව සකස් කිරීමට සැලසුම් කර ඇත. |
| (උ) | සුවසෙවණ පෞද්ගලික රෝහලට අදාළව 2012 අගෝස්තු මස සවි කර තිබූ අඟල් 3 ජල මනුව වෙනුවට අඟල් 1½ ක් පැරණි ජල මනුවට බිල් කිරීම් නිසා, 2012 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් 31 දක්වා වසර 06 ක් වෙනුවෙන් ගාස්තු රු.173,960 ක් අය කර ගෙන නොතිබුණි. | නිවැරදි මනු ගාස්තු අය වීම පිළිබඳව පසු විපරමක් සිදු කළ යුතු වේ. | 3" මනුවට අදාළ හිඟ මනු ගාස්තු සහ ඊට අදාළ වැට් මුදලෙහි එකතුව රු.173,960 ක් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. |
| (ඌ) | කටුගස්තොට මහජන පොදු වැසිකිළියේ බදුකාරිනියගෙන් 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් අය විය යුතු රු.1,013,466 ක ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගත යුතු වේ. | 2017/ 2018 හිඟ මුදල සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා සභාවේ අනුමැතියට යොමු කර තීරණයක් ගැනීමට කටයුතු කරමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට නගර සභාවේ සේවක පුරප්පාඩු 439 ක් හා අතිරික්ත 03 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ. | පුරප්පාඩු 248 ක් සඳහා බඳවා ගෙන ඇති අතර, ඉතිරි පුරප්පාඩු සඳහා ද බඳවා ගැනිමට කටයුතු කරමි. |
| (ආ) | අරුප්පල ආයුර්වේදය සඳහා අනුයුක්ත කර ඇති ඖෂධ සංයෝජකවරිය ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක වීම හේතුවෙන්, නිරන්තර රාජකාරි නිවාඩු ලබා ගැනීම නිසා, අරුප්පල ආයුර්වේදයේ ඖෂධ නිකුත් කිරීමට හා ඖෂධ තොග ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාමට බාධා පැන නැඟී තිබුණි. | රාජකාරි කටයුතු බාධාවකින් තොරව සිදු කළ හැකි පුද්ගලයින් එම තනතුරු සඳහා අනුයුක්ත කර ගත යුතු වේ. | වාර්ෂික නිවාඩුවලට අමතරව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක වීම හේතුවෙන්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 32/91 (III) රාජකාරි නිවාඩු හිමි වේ. |
| (ඇ) | මහා නගර සභාවේ නීති නිලධාරිනියට අමතරව නීති උපදේශකවරයෙකු සිටිය දීත්, සභාවට අදාළ නඩු වෙනුවෙන් පෙනී සිටීම වෙනුවෙන් බාහිර නීතිඥවරුන්ට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් වන විට රු.1,342,386 ක් නීතිඥ ගාස්තු ලෙස ගෙවා තිබුණි. | බාහිර වියදම් අවම වන ආකාරයට කටයුතු කළ යුතු වේ. | වෙනත් ආයතන සඳහා ලැබෙන නීතිපති දෙපාර්තමේන්තු සහාය මහා නගර සභාවට නොලැබෙන බැවින්, අතවශ්‍ය රාජකාරී කටයුතු සඳහා සේවාව ලබා ගත් බව ප්‍රකාශ කරමි. |

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ----------------------------- |
| (අ) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ත්‍රීරෝද රථහිමියන් 1912 ක් ලියාපදිංචි වී ත්‍රීරෝද රථවලින් කොටසකට පමණක් වාර්ෂිකව බිල් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. | වාර්ෂික සමීක්ෂණයක් සිදු කර, ත්‍රීරෝද රථ නැවතුම් ගාස්තු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නාගරික සීමාවේ ත්‍රීරෝද රථ ගාල් විට් බදු ලබාදීම පුද්ගලික ආයතනයකට පවරා ඇති බැවින්, කටුගස්තොට ත්‍රීවීල් 355 ක් සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. |
| (ආ) | ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ජලය අපතේ යෑම පිළිවෙලින් ඝන මීටර් 5294832 ක් හා 3312120 ක් වීමෙන්, පිළිවෙලින් රු.105,896,640 ක් හා රු.66,242,400 ක පාඩුවක් සිදුව තිබුණි. ජලය අපතේ යාම අවම කර ගැනීම සඳහා කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | ජලය අපතේ යෑම මඟින් සිදු වන පාඩුව අවම කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතු වේ. | මනු අක්‍රමිකතා හා බිල් කිරීමේ දෝෂ නිසා, සිදු වන ජලය අපතේ යෑම අවම කිරීම සඳහා පියවර ගන්නා බව දන්වමි. |

3.5 <u>වත්කම් කළමනාකරණය</u>

<u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | -------------------------------- |
| (අ) | රු.130,000 ක් වටිනා යතුරු පැදි 02 ක් වසර 05 ක පමණ කාලයක සිට හා වියළි ඖෂධ කැපීමේ යන්ත්‍ර 03 ක් වර්ෂයක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව නොපැවතීමට කටයුතු කළ යුතු වේ. | භාවිතයට ගත නොහැකි යතුරු පැදි 02 ක වෙන්දේසි කිරීමට හා ඖෂධ කැපීමේ යන්ත්‍ර 02 අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. |
| (ආ) | බෙහෙත් ඔරු 02 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | බෙහෙත් ඔරු 02 විධිමත් ක්‍රමවේදයක් සකස් කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.6 <u>අවිධිමත් ගනුදෙනු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ------------------------------- |
| (අ) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස 2017 අප්‍රේල් 20 දින සිට රාජකාරී කටයුතු ආරම්භ කළ නිලධාරියෙකුට හිමිකමක් නොමැති කාල පරිච්ඡේදයක් වන 2015 පෙබරවාරි 24 දින සිට 2017 අප්‍රේල් 17 දින දක්වා කාලය සඳහා දුරකථන දීමනා වෙනුවෙන් එකතුව රු.450,517 ක් ගෙවා තිබුණි. | දීමනා ගෙවීමේ දී, චක්‍රලේඛ විධිවිධානවලට අනුව නිවැරදිව කටයුතු කළ යුතු වේ. | පත්වීම් ලිපියේ විධිවිධාන ප්‍රකාරව දීමනා ද, පෙර දාතම් කර ගෙවා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂය තුළ දී, බාහිර පාර්ශවයන්ට සැපයුම් ද්‍රව්‍ය සඳහා කලින් ගෙවූ රු.3,195,706 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බාහිර පාර්ශවයන්ට සැපයුම් සඳහා අත්තිකාරම් ගෙවීම අවම කළ යුතු අතර, දී ඇති අත්තිකාරම් පියවා ගැනීම කළ යුතු වේ. | පසුව පිළිතුරු ලබා දෙන බව දන්වමි. |

3.7 <u>හඳුනා ගත් අලාභ</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ වරිපනම් මෘදුකාංගය ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් පරිදි සිදු නොකිරීම නිසා, දැන්වීම් සඳහා අවස්ථා 02 කදී වැය කර තිබුණු රු.103,672 ක වියදම නිෂ්ඵල වියදමක් බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව අනුගමනය කළ යුතු වේ. | පූර්ණ රාජ්‍ය ආයතනයකින් සාර්ථකව මෙම කටයුත්ත කරවා ගැනීමේ අරමුණින් ක්‍රියා කර ඇත. |

3.8 <u>දූශ්‍ය අක්‍රමිකතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් අධ්‍යාපන සහතික වංචනික ලෙස වෙනස් කර ඉදිරිපත් කිරීම සනාථ වී තිබිය දී, ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර, යථෝක්ත නිලධාරිනිය පවුල් සෞඛ්‍ය සේවයේ II පන්තියට උසස් කර, 2008 ජනවාරි 01 දින සිට 2017 ජුලි 31 දින දක්වා රු.3,130,652 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් පාලන කොමසාරිස් විසින් මූලික විමර්ෂණයක් සිදු කිරීමට නාගරික කොමසාරිස් වෙත යොමු කර තිබූ නමුත්, 2018 ඔක්තෝබර් 31 දිනය වන විටත් එකී මූලික විමර්ෂණය සිදු කර නොතිබුණි. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස් විසින් මූලික විමර්ෂණයක් පැවැත්වීමට නිලධාරියෙකු පත් කර ඇති බැවින්, මහා නගර සභාව මඟින් ඉදිරි කටයුතු කර නොමැත. |
| (ආ) | සභාවේ වරිපනම්, මිශ්‍ර ආදායම්, ජල, ගබඩා, ගිණුම් පිළියෙල කිරීමට අදාළ පරිගණක මෘදුකාංගය නිර්මාණය කිරීම සඳහා වූ මිල ගණන් ඇගයීමේ තාක්ෂණික ඇගයීම් වාර්තාවට අත්සන් යෙදීමේ දී, බාහිර කමිටු සාමාජිකයෙකු වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ, පීඨාධිපතිගේ අත්සන ව්‍යාජ ලෙස යොදා රු.8,659,200 වටිනාකමැති පරිගණක මෘදුකාංග සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. | වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | ව්‍යාජ අත්සන් යොදා ඇති බව පිළිගන්නා බවත්, මේ පිළිබඳව මූලික විමර්ෂණයක් හා රස පරීක්ෂණ වාර්තා වංචා හා දූෂණ විමර්ෂණ ආයතනය වෙතින් තවදුරටත් පරීක්ෂා කරන බවත් දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කටුගස්තොට ජල නළ එළීමේ ව්‍යාපෘතිය සඳහා අදාළ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකාවෙන් බැහැරගත කිරීම සඳහා නිවාඩු ඉල්ලුම් කිරීමේ දී පිටරට තමාගේ නඩත්තු වියදම් කොන්ත්‍රාත්කරු විසින් සපයන බවට විෂයභාර අමාත්‍යවරයා හා ආණ්ඩුකාරවරිය වෙත ව්‍යාජව කරුණු දක්වා විදේශ ගමන අනුමත කරවා ගෙන ඇතත්, විදේශගත වීමේ සියලු වියදම් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුවේ අයිතම අංක 1.3 යටතේ රු.1,500,000 ක මුදලක් ඇතුළත් කර 2018 අප්‍රේල් 04 දින කොන්ත්‍රාත්කාර ආයතනයට මහා නගර සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි. | විදේශ ගමන් අනුමත කර ගැනීම නිවැරදි ක්‍රමවේදය යටතේ සිදු කළ යුතු වේ. | සියලුම වියදම් කොන්ත්‍රාත් සමාගම විසින් දරන ලද අතර, එම වියදම් බිල් කිරීම සඳහා ප්‍රමාණ පත්‍රයේ අයිතමයන් ඇතුළත් කර ඇති බැවින්, අදාළ ගෙවීම සිදු කර ඇත. |

3.9 <u>ප්‍රසම්පාදනය</u>

3.9.1 <u>සැපයීම් හා සේවා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | -------------------------------- |
| (අ) | වරිපනම් හා මිශ්‍ර ආදායම් මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීම<br>-------------------------------------------- | | |
| (i) | මෘදුකාංගය නිර්මාණය භාර ගත් ආයතනය විසින් පද්ධතියේ කටයුතු යම් ප්‍රමාණයක් පමණක් සම්පූර්ණ කර, පරිගණක භාෂා භාවිතා කිරීමට නොහැකි වීම, මෘදුකාංග සංවර්ධන පහසුකම නොමැති වීම, මෘදුකාංග නව සංස්කරණය සමඟ යාවත්කාලීන නොවීම වැනි ක්‍රියාකාරීත්වයේ අඩුපාඩු රාශියක් තිබිය දී, මහා නගර සභාවට ලබා දී තිබුණු තාක්ෂණ නිලධාරීන් දෙදෙනා ඉවත් කර අනෙකුත් මෘදුකාංග සංවර්ධන කටයුතු සියල්ල අත්හිටුවා 2018 නොවැම්බර් වන විට සේවා කටයුතුවලින් ඉවත් වී තිබුණි. | ගිවිසුම් පරිදි මෘදුකාංගය නිර්මාණය කර ගත් ආයතනය මඟින් මෘදුකාංගයේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර ගත යුතු වේ. | මෘදුකාංගය තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍ය බැවින්, එම ආයතනයේ සේවය කළ මෘදුකාංග ඉංජිනේරුවරුන්ගේ සහාය ලබාගෙන අංක8(131) හා 2018.12.20 දින දරන සභා සම්මුතිය යටතේ කොන්ත්‍රාත්තුව ඔවුන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. |
| (ii) | මූල්‍ය ශක්තියක් ඇති ආයතනවලින් මිල ගණන් කැඳවීමට කොන්දේසි පනවා තිබිය දී, හා අත්තිකාරම් ගෙවීමේ අවශ්‍යතාවයක් නොතිබිය දී, සේවාකරු සමඟ ගිවිසුම්ගත දිනට මාස 08 කට පෙර රු.2,357,760 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කාර ආයතනය වෙත ගෙවා තිබුණි. | මූල්‍ය ශක්තියක් පවතින ලංසුකරුවන් මඟින් මිල දී ගැනීමේ කොන්දේසි පනවා ඇත්නම්, අත්තිකාරම් මුදල් ලබා නොදිය යුතු වේ. | මහා භාණ්ඩාගාරය 2017 සැප්තැම්බර් වන විට අරමුදල් සැපයීම සීමා කර තිබීම හේතුවෙන්, ඔවුන්ට අත්තිකාරම් මුදලක් ඉල්ලීමේ අවශ්‍යතාවය පැන නැගී තිබූ බැවින්, ගෙවා ඇත. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | මහා නගර සහා සියලු අංශ ජාලගත කිරීමේ ව්‍යාපෘතිය<br>---------------------------------------- | | |
| (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා මහා නගර සහා අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු නොකර, ඉහත ජාලගත කිරීමේ ව්‍යාපෘතිය පැවරූ ආයතනයට ගිවිසුම්ගත වූ දිනට මාස 02 කට පෙර රු.2,192,443 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | අත්තිකාරම් ලබා දීමේ දී, චක්‍රලේඛ හා උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතු වේ. | ලංකා ලොජිස්ටික් ආයතනයට මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය තරම් අරමුදල් සැපයීම සීමා කර තිබූ බැවින්, ඔවුන් විසින් ණයවර ලිපි විවෘත කර තාක්ෂණ උපාංග නගර සභාව වෙත ගෙන්වීමට අවශ්‍ය මුදල් ගිවිසුම්ගත මුදලින් 30% ක් ලෙස ලබාදී ඇත. |
| (ii) | ව්‍යාපෘතියට අදාළ ලංසු ලේඛන අනුව, කොන්ත්‍රාත්කරුගෙන් කොන්ත්‍රාත් මුදලින් රු.730,814 ක් හෙවත්, සියයට 10 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගත යුතු වුවත්, රු.365,407 ක් හෙවත් සියයට 05 ක් පමණක් ලබා ගෙන තිබුණි. | ලංසු ලේඛන පරිදි කාර්යසාධන සුරක්ෂණය ලබා ගත යුතු වේ. | පූර්ණ රාජ්‍ය ආයතනයක් බැවින්, 10% ක කාර්යසාධන සුරක්ෂණයක් නොගෙන සේවා යටතේ 5% ක කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන ඇත. |
| (ඇ) | ජල මනු මිල දී ගැනීම<br>------------------------<br>සභාව ජල මනු මිල දී ගැනීමේ දී, ජල කර්මාන්ත ඉංජිනේරුවරයාගේ නිර්දේශය යටතේ වැඩිම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් රු.400,786 ක මුදලකට මි.මි.20 හා මි.මි.25 ප්‍රමාණයේ ජල මනු 40 ක් මිල දී ගෙන තිබුණි. | ජල මනු මිල දී ගැනීමට පෙර සාම්පල් පරීක්ෂා කිරීම සිදු කිරීම අත්‍යවශ්‍ය වන බව සහ වැඩි මිලක් ගෙවූ මනු ලබා ගැනීම සඳහා සාධාරණ හේතු පැහැදිලි කර දැක්විය යුතු වේ. | මනු මිල දී ගැනීම ජල කර්මාන්ත ඉංජිනේරුවරයාගේ පූර්ව අත්දැකීම් හා දැනුම අනුව, මිල දී ගෙන ඇති බැවින්, හේතු පැහැදිලි කිරීම මග හැරී ගොස් ඇත. ඉංජිනේරුවරයාගේ පූර්ව අත්දැකීම් මත සාම්පල්වල ගුණාත්මකභාවය තීරණය කර ඇත. |

3.9.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ------------------------------ |
| | මහනුවර සිට කටුගස්තොට දක්වා ප්‍රධාන නගරයට යාබදව ජල නළ එළීමේ කර්මාන්තය රු.210,528,076 ක වටිනාකමකට 2016 වර්ෂයේ දී, කොන්ත්‍රාත් ආයතනයකට පවරා තිබූ අතර, ඊට අදාළ විගණන පරීක්ෂාවේ දී, පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | ඉහත ව්‍යාපෘතිය මාගා ඉංජිනියරින් සමාගම වෙත ලබා දිය යුතු බවට ජල කර්මාන්ත ඉංජිනේරු යෝජනා කිරීම හා අවසානයේ රු.210,528,076 ක මුදලකට මාගා සමාගමට ව්‍යාපෘතිය ලබා දී තිබූ බැවින්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වේ. | මෙය පූර්ව සැලසුමක් නොවූ අතර, ක්ෂණිකව ක්‍රියා කළ යුතු කර්මාන්තයක් බැවින්, හා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැනුවත් කිරීම ජල කර්මාන්ත |

| | | | |
|---|---|---|---|
| | | | ඉංජිනේරුවරයාගේ වගකීම බැවින්, එසේ සිදු කර ඇත. |
| (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ) ii ට පටහැනිව කොන්ත්‍රාත්තුවට අදාළ පිරිවිතර පිළියෙල කළ හා නිර්දේශ කළ ප්‍රධාන නාගරික ඉංජිනේරුවරයා හා ජල කර්මාන්ත ඉංජිනේරුවරයා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා හා සාමාජික ලෙස කටයුතු කර තිබුණි. | අදාළ කමිටු සාමාජිකයින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු වේ. | තාක්ෂණ ඇගයීම් කමිටුවේ බහුතරය මෙම නිලධාරීන් දෙදෙනාගෙන් බාහිරව පැවති බැවින්, ස්වාධීන ඇගයීමක් සිදු වේ. |
| (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ) වගන්තිය අනුව, කිසිම සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන දෙකේම සේවය නොකළ යුතු බව දක්වා තිබිය දී, ප්‍රධාන නාගරික ඉංජිනේරුවරයා, ප්‍රධාන ගණකාධිකාරීවරිය හා ගණකාධිකාරී (ආදායම්) යන නිලධාරීන් ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව, කටයුතු කළ යුතු වේ. | නාගරික නිලධාරීන් වෙනුවෙන් පවරා ඇති බලතල පැවරීම අනුව, ඔවුන් ඉටු කළ යුතු කාර්යභාරය ද සැලකිල්ලට ගනිමින් නාගරිකය වශයෙන් සිදු කළ යුතු කාර්යයන් හා කර්තව්‍යයන් මෙහෙයවීම සඳහා සිටින නිලධාරීන් උපමාන සපුරා ගැනීමට සිදු වී ඇත. |
| (iv) | 2013 වර්ෂයේ රු.123,859,887 ක මුදලකට පිළියෙල කර තිබූ ඇස්තමේන්තුවට 2016 රේටයන් පදනම් කර නොගෙන, 2013 ඇස්තමේන්තුව සියයට 30 ක් වශයෙන් රු.37,157,966 ක් වැඩි කර, 2016 වර්ෂයේ ඇස්තමේන්තුව රු.161,017,853 ක් ලෙස පිළියෙල කර තිබුණි. | අදාළ වර්ෂයේ රේටයන් අනුව, ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | වාර්ෂිකව සියයට 10 ක් බැගින් වර්ෂ 03 ක් සඳහා සියයට 30 ක් වැඩි කර ඇස්තමේන්තු පිළියෙල කළ ඇත. |